# හානිපූරණය සඳහා වන කාර්යාලය
# ශ්‍රී ලංකාව
# වාර්ෂික වාර්තාව 2021
# (මූල්‍ය ප්‍රකාශන සඳහා)

හානිපූරණය සඳහා වන කාර්යාලය - ශ්‍රී ලංකාව
අංක 408
ගාලු පාර
කොළඹ 03.

# හානිපූරණය සඳහා වන කාර්යාලය

# 2021 වර්ෂය

## 1. හැඳින්වීම

හානිපූරණය සඳහා වන කාර්යාලයට අදාල (හානිපූරණ කාර්යාලය) ව්‍යවස්ථාපිත විධිනියෝගයන් ක්‍රියාවට නැංවීම අරමුණු කරගෙන සමාලෝචිත වර්ෂය තුල දී ද එම කාර්යාලයේ මෙහෙයුම් කටයුතු නොකඩවා සිදු කරනගෙන යන ලදී. හානිපූරණ කාර්යාලයේ දෙවන වසර මාර්තු මස දී නිමා කරමින් තෙවන වසර ආරම්භ කිරීමත් සමඟම, මෙම කාර්යාලය විසින් පීඩාවට පත් ප්‍රජාවන්ගේ අවශ්‍යතා පිළිබඳ වඩාත් පුළුල් අවබෝධයක් සහිතව එහි වැඩසටහන් නිර්මාණය කිරීමට හැකි විය. ඒ හානිපූරණය කාර්යාලය පීඩාවට පත් තැනැත්තන්හට සේවාවන් ලබා දීම සඳහා කැප වී සිටින බැවිනි.

2018 අංක 34 දරන හානිපූරණය සඳහා වන කාර්යාලය පනතේ වගන්ති අංක 02 ප්‍රකාරව හානිපූරණ කාර්යාලයේ අරමුණු පහත පරිදි වේ-

(1) පීඩාවට පත් තැනැත්තන්ට තනි සහ සාමූහික හානිපූරණය පිළිබඳ ප්‍රතිපත්තීන් විධිමත්ව සකස්කර අමාත්‍ය මණ්ඩලයට නිර්දේශ කිරීම;

(2) මහජන අධ්‍යාපනය, අනුස්මරණය කිරීම සහ ළමයින්, තරුණයන්, කාන්තාවන් සහ ලිංගික හිංසනයට ලක් වූ වින්දිතයන් සහ දුබලතාවයන් සහිත තැනැත්තන් සම්බන්ධයෙන් වන විශේෂිත ප්‍රතිපත්ති ඇතුළුව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලද එම හානිපූරණය සඳහා වන ප්‍රතිපත්ති සඳහා පහසුකම් සැපයීම සහ ක්‍රියාත්මක කිරීම;

(3) ප්‍රතිසන්ධානය අරමුණු කරගත් වෙනත් යාන්ත්‍රණයන් සමඟ අනුකූල වීම තහවුරු කිරීම සඳහා සබඳතා පිහිටුවීම; සහ

(4) යෝග්‍ය පීඩාවට පත් තැනැත්තන්ට හානිපූරණයන් ලබා දීමේ ප්‍රගතිය අධීක්ෂණය කිරීම සහ අගය කිරීම.

## 2. හානිපූරණය සඳහා වන කාර්යාලයේ සාමාජිකයින්

සමාලෝචිත වර්ෂය තුල දී හානිපූරණය සඳහා වන කාර්යාලයේ සාමාජිකයින් පහත පරිදි වේ:

1. ධාරා විජයතිලක මහත්මිය - සභාපතිනි
2. ජේ.එම්.ස්වාමිනාදන් මහතා - සාමාජික
3. ඒ.ඒ.එම්. ෆාතිහු මහතා - සාමාජික
4. සෙල්ලතම්බි සුමිත්‍රා මෙනවිය - සාමාජික
5. මේජර් ජනරාල් (විශ්‍රාමික) පාලිත ප්‍රනාන්දු - සාමාජික (2021 මැයි 24 දින සිට පත්වීම් ලබා ඇත)

හානිපූරණ කාර්යාලයේ ලේකම් කාර්යාලය අධ්‍යක්ෂ ජනරාල්වරයකු විසින් මෙහෙයවනු ලබන අතර එහි රාජකාරි කටයුතු සඳහා සහාය වීමට කාර්ය මණ්ඩලයක් සිටී. 2019 අප්‍රේල් මස ආරම්භයේ සිට වැඩබලන අධ්‍යක්ෂ ජනරාල්වරයෙකු අර්ධ කාලීනව හානිපූරණය කාර්යාලයේ රාජකාරි කටයුතු කළ අතර මෙහි ප්‍රතිඵලයක් ලෙස අපේක්ෂිත අරමුණු ළඟා කරගැනීමෙහිලා එය බාධාවක් විය. නමුත් රාජ්‍ය සේවයේ නියුතු නිලධාරීවරියක් ද්විතීක පදනම මත 2021 අගෝස්තු 02 දින සිට හානිපූරණය සඳහා වන කාර්යාලයේ පළමු පූර්ණ කාලීන අධ්‍යක්ෂ ජනරාල්වරයා ලෙස බඳවා ගැනීමට හැකි විය.

## 3. සමාලෝචිත වර්ෂය තුල දී සිදු කරනු ලැබූ ක්‍රියාකාරකම්

හානිපූරණයන් ප්‍රදානය කිරීම සඳහා හානිපූරණ කාර්යාලය විසින් සකස් කරනු ලැබූ හානිපූරණ ප්‍රතිපත්ති හා මාර්ගෝපදේශයන් 2021 අගෝස්තු මස 17 දිනැතිව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී. මේ මඟින් ප්‍රතිපත්ති අනුමැතිය ලබා ගැනීම සඳහා වන ව්‍යවස්ථාපිත ක්‍රියාවලිය සම්පූර්ණ වන අතර, හානිපූරණ කාර්යාලයේ වැඩසටහන් සඳහා මෙය පදනමක් සපයනු ලබයි. පනතෙහි සඳහන් කර ඇති පරිදි හානිපූරණ ප්‍රතිපත්ති හා මාර්ගෝපදේශයන් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීම සඳහා අධිකරණ අමාත්‍යාංශය විසින් අදාල පියවර ගෙන ඇත.

අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලද ප්‍රතිපත්තීන්හි පීඩාවට පත් තැනැත්තන් වෙත හානිපූරණයන් ප්‍රදානය කිරීම සඳහා අදාල මැදහත්වීම්වල ප්‍රධාන තේමා ක්ෂේත්‍රයන් අටක් (08) ක් සහ අනුගමනය කළ යුතු මාර්ගෝපදේශයන් දහයක් (10) ක් හඳුනාගෙන ඇත.

**මැදිහත්වීම් සඳහා වන ප්‍රධාන තේමා ක්ෂේත්‍රයන්**

I. ජීවනෝපාය සහාය
II. මූල්‍යමය වන්දි ආධාර
III. ඉඩම් අයිතීන් නැවත ලබාදීම සඳහා සහාය
IV. නිවාස සැපයීම සඳහා සහාය
V. ප්‍රජා යටිතල පහසුකම් සංවර්ධනය
VI. පරිපාලන සහන
VII. මනෝසාමාජීය සහාය
VIII. සමඟිය, සංහිඳියාව හා ප්‍රචණ්ඩත්වය නැවත ඇති නොවීම සඳහා පියවර

**හානිපූරණයන් තීරණය කිරීමේ දී සැලකිල්ලට ගනු ලබන මාර්ගෝපදේශයන් 10**

1. වින්දිත කේන්ද්‍රීයතාව - පීඩාවට පත් තැනැත්තන් සඳහා වඩාත්ම හොඳ දේ කුමක් ද යන්න මත පදනම්ව සියලු තීරණ ගනු ඇත.
2. පීඩාවට පත් තැනැත්තන්ට හානිපූරණයන් ලබා ගැනීමට යෝග්‍යතා සඳහා වන නිර්ණායක.
3. යෝග්‍ය පීඩාවට පත් තැනැත්තන් වෙත සපයනු ලබන හානිපූරණයන්ගේ ආකාරය සහ උචිත අවස්ථාවන්හි දී ඒවා සපයනු ලබන ප්‍රමාණය
4. මූල්‍යමය වන්දි සඳහා පීඩාවට පත් තැනැත්තන්ගේ යෝග්‍යතාවය තීරණය කිරීම සඳහා වන නිර්ණායක
5. නොපමාව ලබා දිය යුතු හානිපූරණයන් සඳහා පීඩාවට පත් තැනැත්තන්ගේ යෝග්‍යතාවය පිළිබඳ නිර්ණායක
6. පීඩාවට පත් තැනැත්තන්ට විවිධ ආකාරයේ හානිපූරණයන් සැපයීම හෝ ලබා දීම සඳහා සහාය විය හැකි මණ්ඩලයන්
7. සත්‍යාපනය කරන ලද හානිපූරණය සඳහා වන ඉල්ලීම් සඳහා ප්‍රමුඛතාවය ලබා දීමට පදනම් කරගත යුතු නිර්ණායක
8. තත්‍යභාවය සත්‍යාපනය කිරීමේ නිර්ණායක
9. මියගිය තැනැත්තන් අනුස්මරණය කිරීම හා ස්මාරක සඳහා වන නිර්ණායක
10. පීඩාවට පත් විශේෂ කණ්ඩායම්වල විශේෂ අවශ්‍යතා සපුරාලීම

හානිපූරණය සඳහා වන කාර්යාලය විසින් සිදු කරන ලැබූ ක්‍රියාකාරකම්වල ප්‍රගතිය පහත පරිදි වේ

### 3.1 ජීවනෝපාය සහාය

පීඩාවට පත් ප්‍රජාවන්ගේ ජීවන මට්ටම වැඩි දියුණු කිරීමේ අරමුණ ඇතිව නව ආරම්භක වැඩසටහන් සහ ව්‍යවසායකත්ව වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට අවස්ථාව සලසමින් හානිපූරණ කාර්යාලය විසින් දැනුම සහ තාක්ෂණ හුවමාරු වැඩසටහනක් සංවර්ධනය කරන ලදී. දේශීයව පවතින සම්පත් භාවිත කරමින් නව ව්‍යාපාර ආරම්භ කිරීම

සඳහා පීඩාවට පත් තැනැත්තන්හට අවශ්‍ය දැනුම ලබා දීමේ අරමුණ ඇතිව මෙම වැඩසටහන නිර්මාණය කර ඇත. මේ තුළින් පීඩාවට පත් තැනැත්තන් සාම්ප්‍රදායික කර්මාන්තවල නිරත වීමට වඩා වෙළඳපොළෙහි වැඩි තරඟකාරීත්වයක් ඇති නව අවස්ථා ගවේෂණය කිරීමට ඔවුන්ට ඉඩ ප්‍රස්තාව සලසනු ඇත.

ඒ අනුව පළමු දැනුම සහ තාක්ෂණ හුවමාරු වැඩසටහන 2021 දෙසැම්බර් මස යාපනය දිස්ත්‍රික්කයේ තෙල්ලිපලෙයි ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ කාන්තා ගෘහ මූලිකයින් සඳහා පවත්වන ලදී. මෙම වැඩසටහන සඳහා කාන්තාවන් එකසිය දෙදෙනෙකු (102) සහභාගී වූ අතර, මෙහිදී දේශන මෙන්ම පිරිසිදු පොල්තෙල් පිරිපහදුව, දියර සබන් වර්ග සැකසීම ආදී නව අවස්ථාවන් පිළිබඳ ප්‍රායෝගික නිරූපණයන් ද සිදු කරන ලදී. නව ව්‍යාපාරික අවස්ථාවල නියැලීමට කැමති ප්‍රතිලාභීන්හට උපකාර කිරීම සඳහා අවශ්‍ය ඉදිරි කටයුතු මේ වනවිට සම්බන්ධීකරණය කරමින් පවතී.

### 3.2 වන්දි සහ මූල්‍යමය සහාය:

සමාලෝචිත වර්ෂය තුල දී, හානිපූරණය සඳහා වන කාර්යාලය විසින් හිමිකම් 5,964ක් වන්දි ගෙවීම් සඳහා සකසනු ලැබූ අතර, උතුරු නැගෙනහිර පළාත්වල සිදු වූ ගැටුම් සහ 2006 සහ 2019 වර්ෂ අතරතුර සිදු වූ සිදුවීම් 07ක් හේතුවෙන් සිදු වූ මරණ, ශාරීරික තුවාල හා දේපල හානි සඳහා වන්දි වශයෙන් රු. මිලියන 399.8 ක මුදලක් වන්දි ලෙස ප්‍රදානය කරන ලදී.

**2021 වර්ෂයේ වන්දි ගෙවීම් - ප්‍රධාන අංග**

| | අයිතම | ප්‍රමාණය |
|---|---|---|
| 1 | "පුනරාවර්ත වියදම්" සඳහා මුළු අයවැය වෙන් කිරීම | රු. 900 මිලියන |
| 2 | "පුනරාවර්ත වියදම්" අයවැයෙන් වන්දි ගෙවීම් සඳහා අභ්‍යන්තර වශයෙන් වෙන් කරන ලද මුළු ගණන | රු. 800 මිලියන |
| 3 | මුළු පුනරාවර්ත වියදම් අයවැයෙන් අභ්‍යන්තර වෙන් කිරීම (මිලියන 800) ප්‍රතිශතයක් ලෙස | 88.9% |
| 4 | 2021 ජනවාරි 01 දිනට හානිපූරණ කාර්යාලයේ වන්දි සඳහා සැකසීමට තිබූ හිමිකම් අයදුම්පත් ගණන | 12,262 |
| 5 | සමාලෝචිත වසර තුළ දී ලැබුණු නව අයදුම්පත් ගණන | 5,827 |
| 6 | 2021 ජනවාරි 01 දිනට ගෙවීම් සඳහා අනුමත කරන ලද සහ ගෙවා අවසන් කිරීම සඳහා තිබූ හිමිකම් අයදුම්පත් ගණන | 2,950 |
| 7 | සමාලෝචිත වසර තුළ දී වන්දි සඳහා සකස් කරන ලද සහ ගෙවීම් සඳහා අනුමත කරන ලද හිමිකම් අයදුම්පත් ගණන | 3,208 |
| 8 | ගෙවා අවසන් කරන ලද හිමිකම් ගණන | 5,964 |
| 9 | හිමිකම් අයදුම්කරුවන් 5,964 දෙනෙකුට ගෙවන ලද මුළු මුදල | රු. 399.8 මිලියන |
| 10 | වසර අවසානයේ දී ගෙවීම් සඳහා අනුමත කරන ලද සහ ගෙවා අවසන් කිරීමට තිබූ හිමිකම් ගණන | 194 |
| 11 | වසර අවසාන වන විට ගෙවීම් සඳහා අනුමත කරන ලද ගෙවා අවසන් කිරීමට අවශ්‍ය මුළු මුදල | රු. 7.9 මිලියන |

2021 වසර තුල වන්දි ගෙවීම් සඳහා රු. මිලියන 800 ක මුදලක් වෙන් කළ ද, කොවිඩ් 19 වසංගත තත්ත්වය හේතුවෙන් දිගින් දිගටම රට අගුළු දැමීම් සහ සංචරණ සීමා පැනවීමට සිදු වීම නිසා එහි ප්‍රතිඵලයක් ලෙස හිමිකම් ලිපිගොනු සැකසීමේ කටයුතු සඳහා බාධා විය.

වන්දි ගෙවීම්වලට අමතරව, පුනරුත්ථාපන අධිකාරිය විසින් ආරම්භ කරන ලද ණය වැඩසටහනක් ද හානිපූරණය සඳහා වන කාර්යාලය විසින් නොකඩවා සිදු කරගෙන යන ලදී. මහා භාණ්ඩාගාරය විසින් ලංකා බැංකුව වෙත නිදහස් කරන ලද මුදල් එම බැංකුව මඟින් ණය වශයෙන් ලබා දෙන ලදී. මෙම ණය ලබා දීම සඳහා යෝග්‍ය ප්‍රතිලාභීන් තෝරා ගැනීමේ දී හානිපූරණ කාර්යාලයේ නිලධාරීන් සහ බැංකු නිලධාරීන් විසින් අයදුම්කරුවන්ව ඇගයුම් කිරීම සහ නිර්දේශ කිරීම කරනු ලබයි. මෙම ණය යෝජනා ක්‍රමය යටතේ ස්වයං රැකියා අවස්ථාවන් සඳහා සහ නිවාස ආධාර ලෙස පීඩාවට පත් තැනැත්තන් වෙත මූල්‍යමය සහාය ලබා දෙනු ලබයි. තවද, සමාජගත කරන ලද අභ්‍යාසලාභීන් සඳහා ද ස්වයං රැකියා සඳහා ණය ලබා දෙනු ලබයි. මෙහිදී, වාර්ෂික පොලී අනුපාතය 2% කට රු. 250,000 ක උපරිම ණය මුදලක් මෙම යෝජනා ක්‍රම යටතේ ලබා දෙනු ලබයි. ඉහත ණය යෝජනා ක්‍රමයන්හි ප්‍රගතිය පහත පරිදි වේ:

| **ණය යෝජනා ක්‍රමය** | **2021 වසර තුළ දී ණය ලැබීම සඳහා හානිපූරණය සඳහා වන කාර්යාලය විසින් නිර්දේශ කරන ලද ගණන** | **2021 වසර තුළ දී ලංකා බැංකුවෙන් ණය ලබා ගත් ප්‍රතිලාභීන් ගණන** | **ණය වශයෙන් ලබා දෙනු ලැබූ මුදල (රු.)** |
|---|---|---|---|
| පීඩාවට පත් තැනැත්තන් සඳහා ස්වයං රැකියා ණය ආධාර | 211 | 206* | 43,200,000 |
| පීඩාවට පත් තැනැත්තන් සඳහා නිවාසාධාර | 65 | 65 | 16,250,000 |
| සමාජගත කරන ලද අභ්‍යාසලාභීන් සඳහා ස්වයං රැකියා සඳහා ආධාර | 20 | 18 | 4,450,000 |
| **එකතුව** | **296** | **289** | **63,900,000** |

***** 2020 වසර තුළ දී නිර්දේශ කරන ලද ප්‍රතිලාභීන් ගණන ද මෙයට අයත් වේ.

ප්‍රතිලාභීන්ට ඇපකර ඉදිරිපත් කිරීමට ඇති අපහසුතාවය හේතුවෙන් හානිපූරණ කාර්යාලය විසින් ණය ලබා දීමට නිර්දේශ කරන ලද සියළු ප්‍රතිලාභීන්හට ණය ලබා දීමට බැංකුවට හැකියාවක් නොමැති බව නිරීක්ෂණය විය. ස්වයං රැකියා ව්‍යාපෘති අලුතින් ආරම්භ කිරීමට හෝ දැනට කර ගෙන යන ස්වයං රැකියා නොකඩවා කර ගෙන යෑම සඳහා මූල්‍යමය සහාය අවශ්‍ය තැනැත්තන්හට වඩාත් හොඳ ප්‍රතිඵල ළඟා කර ගැනීම සඳහා දැනට ක්‍රියාත්මක යෝජනා ක්‍රමය ප්‍රතිනිර්මාණය කිරීමේ අරමුණින් සාකච්ඡාවන් පවත්වන ලදී.

### 3.3 ඉඩම් අයිතිය නැවත පැවරීම; නිවාස සහාය ලබා දීම, ප්‍රජා යටිතල පහසුකම් සංවර්ධනය; පරිපාලන සහාය

දැනටමත් දිස්ත්‍රික් මට්ටමින් බොහෝ වැඩසටහන් ක්‍රියාත්මක කර ඇති හෙයින්, එම වැඩසටහන්වල ඇති හිදැස් හඳුනා ගැනීම සඳහා හානිපූරණ කාර්යාලය දිස්ත්‍රික් පරිපාලනය සමඟ එක් ව කටයුතු කිරීම පිළිබඳව සැලකිල්ලට ගන්නා ලදී. මේ අරමුණින්, හානිපූරණ කාර්යාලයේ කාර්යභාරය සහ විධිවිධානයන් පිළිබඳව දැනුවත් කිරීමටත් අවශ්‍ය සහාය පිළිබඳව සාකච්ඡා කිරීමටත් දිස්ත්‍රික්ක 25හිම දිස්ත්‍රික් ලේකම්වරුන් සමඟ හමුවක් පවත්වන ලදී. තවද, පීඩාවට පත් ප්‍රජාවන්ගේ අවශ්‍යතා හඳුනා ගැනීම සඳහා දිස්ත්‍රික් සහ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ මට්ටමින් තොරතුරු එක් රැස් කිරීම සඳහා හානිපූරණ කාර්යාලය විසින් ප්‍රශ්නාවලියක් බෙදා හරින ලදී. අනතුරුව, අදාල වැඩසටහන් සඳහා එකී අවශ්‍යතාවයන් ඇතුළත් කිරීමේ හැකියාවක් තිබේ ද යන්න සොයා බැලීම සඳහා අදාල රාජ්‍ය ආයතන සමඟ සාකච්ඡා පවත්වනු ඇත.

### 3.4 මනෝසාමාජීය සහාය

ගැටුම් හේතුවෙන් පීඩාවට පත් තැනැත්තන්ට එම ගැටුම් නිසා සිදු වූ බලපෑම අතිමහත් බව හඳුනා ගෙන ඇති අතර, ඒ වෙනුවෙන් පිළියම් ලබා දීමට ඇති අවශ්‍යතාවය විශේෂයෙන්ම සැලකිල්ලට බඳුන් කර ඇත. මේ සඳහා මනෝසාමාජීය සහාය නියමු වැඩසටහනක් නිර්මාණය කර ඇති අතර, ඒ වෙනුවෙන් සමාලෝචිත වර්ෂය තුළ දී සිද්ධි කලමනාකරුවන් 26 දෙනෙකු පුහුණු කරන ලදී. මෙකී පුහුණුව ජාත්‍යන්තර වශයෙන් පිළිගත් මූලධර්මයන්ට සහ ප්‍රමිතීන්ට අනුකූලව සිදු කරන ලදී. වරින් වර පැවති කොවිඩ්-19 නීති සහ සෞඛ්‍ය මාර්ගෝපදේශ හේතුවෙන් මෙම පුහුණු වැඩසටහන්වලින් බොහොමයක් අථත්‍ය (virtual) ආකාරයෙන් පවත්වන ලදී. කිලිනොච්චි, මඩකලපුව, අම්පාර, කුරුණෑගල සහ මාතර යන නියමු වැඩසටහන සඳහා තෝරා ගත් දිස්ත්‍රික්කවලින් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 05 ක වෙසෙන පීඩාවට පත් පවුල් 136 ක් තෝරා ගෙන ඔවුන් සමඟ ක්ෂේත්‍ර මට්ටමින් අදාල කටයුතුවල නියැලෙමින් මෙම නියමු වැඩසටහන සමාලෝචිත වර්ෂය තුළ දී ආරම්භ කරන ලදී. මෙම ක්ෂේත්‍ර රාජකාරි කටයුතු 2022 මාර්තු මස වන විට අවසන් වීමට නියමිත අතර, 2022 වසරේ ජුනි මස දක්වා ආසන්න වශයෙන් මාස 06 ක කාලයක් පමණ ඉහත කී සිද්ධි කලමනාකරුවන් මෙම ක්‍රියාවලියෙහි නියැලෙනු ඇත.

### 3.5 සමඟිය, සංහිඳියාව හා ප්‍රචණ්ඩත්වය නැවත ඇති නොවීම සඳහා පියවර

මේ යටතේ ක්‍රියාවට නැංවිය යුතු වැඩසටහන් කිහිපයක් දැනටමත් හඳුනා ගෙන, ඒ පිළිබඳ සාකච්ඡා කරමින් පවතින අතර යථා කාලයේ දී ඒවා ක්‍රියාවට නැංවීම සඳහා අදාල රජයේ සහ සිවිල් සමාජ සංවිධාන ඇතුළු අදාල පාර්ශ්වකරුවන් සමඟ එකව කටයුතු කරනු ඇත. ප්‍රාථමික ශ්‍රේණිවල සිසුන් අතර සමඟිය සහ ඒකීයබව ප්‍රවර්ධනය කිරීමේ අරමුණින් රූප කතා පොතක් හඳුන්වා දීමේ අරමුණින් අධ්‍යාපන අමාත්‍යාංශය සමඟ මූලික සාකච්ඡාවන් පවත්වන ලදී.

අතුරුදන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලයේ (OMP), ජාතික සමඟිය හා ප්‍රතිසන්ධානය සඳහා වන කාර්යාලයේ (ONUR) සහ හානිපූරණ කාර්යාලයේ අරමුණුවල ඇති පොදුබව සැලකිල්ලට ගනිමින්, ඒ මත පදනම්ව හානිපූරණ කාර්යාලයේ සාමාජිකයන් විසින් "සාමූහික සංසදය" (Unity Cluster) නම් ඒකාබද්ධ උපදේශන කණ්ඩායමක් ආරම්භ කර ඇත. මෙම කණ්ඩායම නිරන්තරයෙන් රැස් වී ආයතන ත්‍රිත්වයම සඳහා පොදු වැඩසටහන් සහ සහාය ක්ෂේත්‍රයන් පිළිබඳ සාකච්ඡා කරන අතර, ඒ තුළින් වැඩසටහන් ද්විත්වකරණයවීම වළක්වා සම්පත් වඩාත් අර්ථවත් අයුරින් භාවිතයට ගැනීම ප්‍රවර්ධන කරනු ලබයි.

### 3.6 අනෙකුත් ප්‍රධාන වැඩසටහන්

- **පාර්ශ්වකරුවන් අතර දැනුවත්බව ඇති කිරීම**

අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලද හානිපූරණ ප්‍රතිපත්ති සහ මාර්ගෝපදේශයන් සහ හානිපූරණයන් ප්‍රදානය කිරීමේ දී හානිපූරණ කාර්යාලයේ කාර්යභාරය පිළිබඳව විවිධ පාර්ශ්වකරුවන් දැනුවත් කිරීම සඳහා හානිපූරණ කාර්යාලය විසින් ඉදිරිපත් කිරීම් කරන ලදී. එම ඉදිරිපත් කිරීම්වල සාරාංශය පහත පරිදි වේ -

  - **සංවර්ධන කොටස්කරුවන් -** 2021 ඔක්තෝබර් 08
  - බටර්ෆ්ලයි පීස් ගාර්ඩන් සිවිල් සමාජ සංවිධානය - 2021 ඔක්තෝබර් 27
  - ගරු ආණ්ඩුකාරතුමා සහ උතුරු පළාතේ දිස්ත්‍රික් ලේකම්වරුන් අතර හමුව - 2021 ඔක්තෝබර් 29
  - **සිවිල් සමාජ එකතුව -** 2021 නොවැම්බර් 09
  - මුස්ලිම් කාන්තා සංවර්ධන භාරය (පුත්තලම දිස්ත්‍රික්කයේ අවතැන් වූ ප්‍රජාව) - 2021 නොවැම්බර් 25
  - මඩකලපුව දිස්ත්‍රික්කයේ ආබාධිත ක්‍රියාකාරී කමිටුව - 2021 දෙසැම්බර් 21

- **සිවිල් සමාජ සංවිධාන සමඟ කටයුතු කිරීම:**

ප්‍රතිපත්ති සහ මාර්ගෝපදේශ සකස් කිරීමට ප්‍රථම හානිපූරණ කාර්යාලය විසින් සිවිල් සමාජ සංවිධාන හමු වී ඔවුන්ගේ ප්‍රතිපෝෂණ ලබා ගන්නා ලදී. මෙම කාර්යාලය විසින් ක්ෂේත්‍ර මට්ටමින් වැඩසටහන් ක්‍රියාත්මක කිරීමේ දී සහ විශේෂයෙන්ම එක්ව කටයුතු කිරීම තුළින් සම්පත් ප්‍රමාණය වර්ධනය කර ගැනීම සඳහා මෙකී සංවිධානවල සහාය සුරක්ෂිත කර ගැනීමට ඇති වැදගත්කම හානිපූරණ කාර්යාලය විසින් සැලකිල්ලට බඳුන් කරන ලදී. මෙම කරුණු සැලකිල්ලට ගනිමින්, හානිපූරණ කාර්යාලය විසින් 2021 ඔක්තෝබර් 15 දිනැතිව සිවිල් සමාජ සංවිධාන සමඟ සංවාදයක් සිදු කළ අතර, මේ සඳහා සංවිධාන 30ක් නියෝජනය කරමින් 40 දෙනෙකු පමණ සහභාගී විය. මෙම සාකච්ඡාවේ ඉදිරි පියවරක් ලෙස හානිපූරණ කාර්යාලය විසින් පීඩාවට පත් ප්‍රජාවන්ගේ සුභසිද්ධිය උදෙසා

වන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම පිළිබඳ සාකච්ඡා කිරීම සඳහා සිවිල් සමාජ සංවිධාන කිහිපයක් සමඟ ද්විපාර්ශ්වීය සාකච්ඡා පවත්වන ලදී.

- **නව හානිපූරණ රෙජීමය පිළිබඳ ප්‍රශ්න හා පිළිතුරු පොත් පිංච (Q&A Booklet) ප්‍රකාශයට පත් කිරීම**

පීඩාවට පත් තැනැත්තන් සමඟ සමීපව කටයුතු කරන තැනැත්තන්හට සහ ශ්‍රී ලංකාවේ හානිපූරණ රෙජීමය පිළිබඳ තොරතුරු දැන ගැනීමට බලාපොරොත්තු වන තැනැත්තන්හට අවශ්‍ය තොරතුරු ලබා අරමුණින් හානිපූරණ කාර්යාලය විසින් 2021 මාර්තු මස ප්‍රශ්න හා පිළිතුරු පොත් පිංචක් මුද්‍රණය කර බෙදා හරින ලදී. හානිපූරණ ප්‍රතිපත්ති සහ මාර්ගෝපදේශයන්ට අමාත්‍ය මණ්ඩල අනුමැතිය හිමි වීමට සමගාමීව, අනුමත කරන ලද යම් යම් ප්‍රතිපත්තිවල ඉදිරිදර්ශන ඇතුළත් කරමින් ප්‍රශ්න හා පිළිතුරු පොත් පිංච නැවත මුද්‍රණය කිරීමේ වැදගත්කමක් මතු විය. ඒ අනුව, 2022 දෙසැම්බර් මස දී ප්‍රශ්න හා පිළිතුරු පොත් පිංචෙහි නව මුද්‍රණයක් ප්‍රකාශයට පත් කරන ලදී.

- **තොරතුරුවල විනිවිදභාවය සහ බෙදා හැරීම**

මහජනයා වෙත යෝග්‍ය හා නිවැරදි තොරතුරු ලබා දීමේ අරමුණෙන් හානිපූරණ කාර්යාලයේ වෙබ්අඩවිය ප්‍රතිසංස්කරණය කර, භාෂා ත්‍රිත්වයෙන්ම සියළු තොරතුරු ඇතුළත් කරන ලදී. පීඩාවට පත් තැනැත්තන්ගේ තොරතුරුවල රහස්‍යභාවය ආරක්ෂා වන අයුරින් වෙබ් අඩවිය තුළ තොරතුරු කළමනාකරණය කර ඇත.

ඊට අමතරව, පීඩාවට පත් තැනැත්තන්හට හානිපූරණයන් ප්‍රදානය කිරීමේ දී සාක්ෂි මත පදනම්ව තීරණ ගැනීමට හැකි අයුරින් හානිපූරණ කාර්යාලයේ තොරතුරු කළමනාකරණ පද්ධතිය ද වැඩි දියුණු කරන ලදී.

- **හානිපූරණ කාර්යාලයේ කාර්ය මණ්ඩලය දැනුවත් කිරීම:**

ගැටුම්වලින් පීඩාවට පත් තැනැත්තන් සමඟ කටයුතු කිරීමේ දී අනුගමනය කළ යුතු වින්දිත කේන්ද්‍රීය ප්‍රවේශය පිළිබඳව හානිපූරණ කාර්යාලයේ කාර්යමණ්ඩලය දැනුවත් කිරීමේ සහ බලමුළු ගැන්වීමේ වැදගත්කම හානිපූරණ කාර්යාලය විසින් සැලකිල්ලට ගන්නා ලදී. ඒ අනුව**,** සමාලෝචිත වර්ෂය තුළ දී හානිපූරණ කාර්යාලයේ කාර්ය මණ්ඩලය සඳහා පහත වැඩමුළු පවත්වන ලදී **-**

  - සමානාත්මතාවය සහ යුක්තිය සඳහා වූ කේන්ද්‍රය විසින් පවත්වන ලද ස්ත්‍රී පුරුෂභාවය සහ හානිපූරණය පිළිබඳ සැසිය.
  - කාන්තා පිහිට ආයතනය විසින් පවත්වන ලද ගෘහස්ථ හිංසනය පිළිබඳ දැනුවත් කිරීමේ සැසිය.
  - 2021 වසරේ ලෝක මානසික සෞඛ්‍ය දිනය සැමරීම නිමිත්තෙන් පීඩාවට පත් තැනැත්තන්ගේ මානසික තත්ත්වයන් සහ සහන ලබා දීමේ දී හානිපූරණ කාර්යාලයේ කාර්ය මණ්ඩලයේ කාර්යභාරය පිළිබඳව හානිපූරණ කාර්යාලයේ මනෝසාමාජීය සහාය උපදේශක විසින් පවත්වන ලද සැසිය.
  - හානිපූරණ කාර්යාලය විසින් පුහුණු කරන ලද සිද්ධි කළමනාකරුවන් විසින් ඔවුන්ගේ සැබෑ අත්දැකීම් මත පදනම්ව ආතතිය සහ එය කළමනාකරණය කිරීම පිළිබඳ පවත්වන ලද සැසිය.
  - සේවාවන් ලබා දීමේ දී පොදු සහ ප්‍රතිඵල කේන්ද්‍රීය ප්‍රවේශයක් යොදා ගැනීම මූලික අරමුණ කර ගනිමින් අධ්‍යක්ෂ ජනරාල්තුමිය විසින් හානිපූරණ ප්‍රතිපත්ති සහ මාර්ගෝපදේශයන් පිළිබඳ පවත්වන ලද දැනුවත් කිරීමේ සැසිය.
  - පීඩාවට පත් තැනැත්තන්ගේ අවශ්‍යතා තේරුම් ගැනීම පිළිබඳව පුනරුත්ථාපන කොමසාරිස් ජනරාල්වරයා විසින් 2022.01.24 දිනැතිව පවත්වන ලද දැනුවත් කිරීමේ සැසිය.

## 4. ලේකම් කාර්යාලය

හානිපූරණ කාර්යාලයේ ලේකම් කාර්යාලයේ සේවක සංඛ්‍යාව පහත පරිදි වේ:

| තනතුර | අනුමත කර ඇති තනතුරු සංඛ්‍යාව | පුරප්පාඩු |
|---|---|---|
| අධ්‍යක්ෂ ජනරාල් | 01 | - |
| අධ්‍යක්ෂ | 01 | 01 |
| නියෝජ්‍ය අධ්‍යක්ෂ/ සහකාර අධ්‍යක්ෂ | 04 | 01 |

| | | |
|---|---|---|
| පරිපාලන නිලධාරි | 01 | - |
| අභ්‍යන්තර විගණක | 01 | - |
| හානිපූරණ නිලධාරී | 22 | 09 |
| භාෂා පරිවර්තක | 01 | - |
| අභ්‍යන්තර විගණක සහායක | 01 | 01 |
| කලමනාකරණ සහකාර | 30 | 09 |
| රියදුරු | 07 | 02 |
| කාර්යාල සහායක | 07 | - |
| ආරක්ෂක නියාමක | 01 | - |
| **එකතුව** | **55** | **23** |

ඉහත තනතුරුවලට අමතරව, පහත ක්ෂේත්‍රයන්ට අදාලව සේවාවන් ලබා ගැනීම සඳහා සංක්‍රමණය සඳහා වන ජාත්‍යන්තර සංවිධානය (IOM) මඟින් පූර්ණ කාලීන උපදේශයකවරුන්ගේ සහාය මෙම කාර්යාලය වෙත ලබා දී ඇත-

1. උපදේශක - පර්යේෂණ සහ වැඩසටහන්
2. උපදේශක - මනෝසාමාජීය සහාය
3. උපදේශක - වැඩසටහන්

හානිපූරණ කාර්යාලයේ දැනට පවතින සැලකිය යුතු අභියෝගයක් වී ඇති වන්දි ලිපිගොනු කටයුතුවලට අදාලව රාජකාරි කරන කාර්ය මණ්ඩලයේ ඇති පුරප්පාඩු (41%ක් හානිපූරණ නිලධාරීන් සහ 30%ක් කලමනාකරණ සහකාර නිලධාරීන්) පිරවීමට කටයුතු කරනු ඇත.

## 5. මූල්‍ය ප්‍රගතියේ සාරාංශය

2021 වසර සඳහා අයවැය වෙන් කිරීම වශයෙන් රුපියල් මිලියන 910 ක මුදලක් හානිපූරණ කාර්යාලය වෙත ලැබුණු නමුත් පැවැති කොවිඩ්-19 වසංගත තත්ත්වය හමුවේ රජය විසින් දිගින් දිගටම සිදු කරනු ලැබූ රට අගුළු දැමීම් හේතුවෙන් අපේක්ෂිත වියදම් ප්‍රමාණය සිදු කිරීමට නොහැකි විය. මෙහි ප්‍රතිඵලයක් ලෙස සහ රේඛීය අමාත්‍යාංශයෙන් ඉල්ලුම් කළ පරිදි පුනරාවර්ත අයවැයෙන් රු. මිලියන 400 ක් සහ ප්‍රාග්ධන අයවැයෙන් රු. මිලියන 03 ක මුදලක් ඉතිරි කිරීම් ලෙස හඳුනා ගෙන ඇත.

සමාලෝචිත වර්ෂය සඳහා වන මූල්‍ය ප්‍රගතියේ සාරාංශය පහත පරිදි වේ:

| **අයිතමය** | **වෙන් කිරීම (රු. මිලියන)** | **ලැබුණු අක්මුදල් ප්‍රමාණය (රු. මිලියන)** | **වියදම (රු. මිලියන)** | **ලැබූ අක්මුදල්වල වියදම ප්‍රතිශතයක් ලෙස** | **සටහන්** |
|---|---|---|---|---|---|
| | | පුනරාවර්ත | | | |
| වැටුප් සහ වේතන | 42.00 | 40.50 | 40.50 | 100% | අමතර රු. මිලියන 4.12 ක වියදමක් ජනනය කරන ලද ලදුපත්වලින් පියවා ගන්නා ලදී |
| වෙනත් පුනරාවර්තන | 58.00 | 29.00 | 29.00 | 100% | අමතර රු. මිලියන 14.04ක වියදමක් ජනනය කරන ලද ලදුපත්වලින් පියවා ගන්නා ලදී |
| වන්දි ගෙවීම් | 800.00 | 399.83 | 399.83 | 100% | |

| | | | | | |
|---|---|---|---|---|---|
| එකතුව | **900.00** | **469.83** | **469.33** | **100%** | |
| ප්‍රාග්ධන | | | | | |
| ප්‍රාග්ධන | 10.00 | 7.00 | 2.41 | 0.17% | ප්‍රසම්පාදන සඳහා ප්‍රතිචාර ලැබීම ප්‍රමාදවීම හේතුවෙන් භාවිතය අඩු විය. |
| මුළු එකතුව | **910.00** | **476.83** | **471.44** | **99%** | |

## 6. කෘතඥතාවය

හානිපූරණ කාර්යාලයේ ප්‍රධාන වැඩසටහන් බොහෝ ගණනක් ක්‍රියාවට නැංවීමේ දී සංක්‍රමණය සඳහා වන ජාත්‍යන්තර සංවිධානය (IOM) විසින් ලබා දුන් සහයෝගය පිළිබඳ හානිපූරණ කාර්යාලයේ හෘදයාංගම ස්තුතිය පළ කර සිටිමු. තවද, මෙම කාර්යාලයේ අරමුණු සාක්ෂාත් කර ගැනීමෙහිලා ඔවුන් විසින් මහඟු දායකත්වයක් ලබා දුන් බව සඳහන් කළ යුතු ය.

**නසීමා අහමඩ්**
**අධ්‍යක්ෂ ජනරාල්**
**හානිපූරණය සඳහා වන කාර්යාලය**
**ශ්‍රී ලංකාව.**

**හානිපූරණය සඳහා වන කාර්යාලය**
**අංක 408, ගාලු පාර,**
**කොළඹ - 03.**